# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2446/40 – 2025 ජූලි මස 22 වැනි අඟහරුවාදා – 2025.07.22**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2018/130.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.04.23 දිනැති හා අංක 2224/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.03.29 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් තල්පේ, පිටිදූව, "ගුණ සෙවන" හි පදිංචි ජේ. ආර්. ජයතුංග මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 39/2021 හා 2025.06.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජූලි මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය - IR/COM/05/2018/130.

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය

ජේ. ආර්. ජයතුංග මහතා,
“ගුණ සෙවන”
පිටදූව, තල්පේ

නඩු අංකය - A/39/2021

*පළමු පාර්ශ්වය*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
නො. 200, කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය අනුව ඔහු වෙත පැවරී ඇති බලතල අනුව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2021.03.29 දිනැති නියෝගයෙන් බේරුම්කරුවකු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට හේතු වී ඇති කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ:

“ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කළුතර ප්‍රාදේශීය පාලන කාර්යාලයේ සේවය කළ ජේ. ආර්. ජයතුංග මහතා හට,

01. ආවරණ පත්වීම් ලබා දුන් දිනය වන 2015.03.01 වන දින සිට ප්‍රාදේශීය ධාවන කළමනාකාර තනතුරට හිමි (ii) දෙවන ශ්‍රේණියේ වැටුප් ලබා නොදීම.

02. 2015.03.01 වන දින සිට 2016 ජූනි මස දක්වා වූ ධාවන කළමනාකාර තනතුරට හිමි රු. 5000/- (රුපියල් පන්දාහේ) තනතුරු දීමනා හිඟ මුදල් ලබා නොදීම.

03. සභාපතිතුමා විසින් අනුමත කර ලබා දුන් වේතන වර්ධක (05) පහ ලබා නොදීම.

මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.”

ජේ. ආර්. ජයතුංග මහතා, 1977.03.23 දින X ශ්‍රේණියේ නිලධාරියෙකු ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයට බැඳී ඇත. එකී දින සිට නුගේගොඩ ජංගම අංශයට අනුයුක්ත කර තිබේ. අනතුරුව 2006 වර්ෂයේ කළුතර ප්‍රාදේශීය පාලන කාර්යාලයට අනුයුක්තව v ශ්‍රේණියේ නිලධාරියෙකු වශයෙන් සේවය කර ඇත.

2015.03.01 දින සිට එම ප්‍රාදේශීය පාලන කාර්යාලයේ ප්‍රාදේශීය ධාවන කළමනාකාර තනතුරට පත් කෙරිණි.

එකී පත්වීම ආවරණ පත්වීමක් ලෙස ලබා දී ඇති අතර එකී ආවරණ පත්වීම මාස 06 කට පසුව ස්ථිර තනතුර ප්‍රදානය කරනු ලබන බව ශ්‍රී ලංගම ප්‍රධාන විධායක නිලධාරි විසින් වාචිකව ලබා දුන් පොරොන්දුව මත අදාළ තනතුරේ සේවය කිරීමට ඉදිරිපත් විය. එහෙත් එම වාචික පොරොන්දුව 2017.05.17 දින විශ්‍රාම ලබා සේවය අවසන් කළද පත්වීමෙහි ස්ථිර කර නැත.

ඔහු විශ්‍රාම යවා ඇත්තේ ප්‍රාදේශීය ධාවන කළමනාකාර ආවරණ පත්වීමෙනි. එම ආවරණ පත්වීම 2015.03.01 දින සිට 2017.05.17 දක්වා වූ වර්ෂ අවුරුදු 02, මාස 02, දින 01 කි.

පළමු පාර්ශ්වය වන ජයතුංග මහතා මෙම පසුබිම මත බේරුම්කරණ අධිකරණයේ සහය ඉල්ලා සිටීමට හේතු වූ කරුණු 03 කි.

01. 2015.03.01 දින සිට 2017.05.17 දක්වා වූ වර්ෂ 02, මාස 02, දින 01ක කාලය සඳහා පත්වීම ස්ථිර කර දීම.

02. අදාළ තනතුරට හිමි III A ශ්‍රේණියේ පිහිටුවා තනතුර ස්ථිර කිරීම හා ඊට අදාළ වැටුප් තලයේ එනම් 19,480.00 + 10*365 + 2*550 = 24230.00 හි පිහිටුවා හිඟ වැටුප් ගෙවීම.

03. 2015.03.01 දින සිට 2016 ජුනි මස දක්වා ධාවන කළමනාකරුට හිමි රු.5000/= දීමනාව ලබා දීම.

ජේ. ආර්.ජයතුංග මහතා විශ්‍රාම ගැන්වීමේ, ලිපිය නිකුත් කිරීමේදී වර්ෂ 40ක විශිෂ්ඨ සේවයක් ශ්‍රී ලංගම ගමනා ගමන මණ්ඩලයට ලබා දී ඇති බවට සඳහන් කොට ඇත.

විශ්‍රාම ගැන්වීමේ ලිපිය තුළින් වර්ෂ 40ක විශිෂ්ඨ සේවය ගැන ප්‍රසාදය පළ කළද ඔහුගේ සේවය ස්ථිර කිරීමට, අදාළ ශ්‍රේණියේ ලබාදීමට හා නියමිත වැටුප් තලයේ පිහිටු වීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ පාලන අධිකාරිය ක්‍රියා නොකිරීමට හේතු කිසිවක් පැහැදිලි නැත.

2015.03.01. දින ආවරණ පත්වීම ලබා දීමේදී මාස 06න් පසුව තනතුර ස්ථිර කිරීමට කටයුතු කරන බවට ප්‍රධාන විධායක නිලධාරි ලබා දුන් වාචික පොරොන්දුව හුදෙක් ප්‍රකාශයක් පමණක් බවට පත්වීම තුළින් සේවක අභිප්‍රේරණය කෙරෙහි පාලන අධිකාරිය දක්වා ඇති නොසැලකිල්ල පැහැදිලිය.

මානව සම්පත් කළමනාකරණය පිළිබඳව කිසිදු සැලකිල්ලක් නොදැක්වීම තුළින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය තුළ කිසිදු සාධනීය ක්‍රියා පිළිවෙලක් නොතිබූ බව පැහැදිලිය. එහෙයින් සිය සේවක හා කාර්ය මණ්ඩලයේ ඵලදායිතාව නංවා ගැනීමට අපොහොසත් වී ඇති බව නිගමනය වේ.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය තුළ දක්නට ඇති පොදු දුර්වලතාවයන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ද දක්නට ඇති බව ජේ. ආර්. ජයතුංග මහතාගේ බේරුම්කරණ කාර්ය තුළින් පැහැදිලි වේ.

01. නොසැලකිල්ල
02. අලස බව
03. පසුගාමිත්වය

මෙම අභාග්‍ය සම්පන්න පොදු කරුණු රාජ්‍ය සේවය තුළින් මුලිනුපුටා දමන තෙක් මෙවැනි බේරුම්කරණ සඳහා කෙරෙන ඉල්ලීම් නවතාලීමට කිසිදු හැකියාවක් නැත.

දෙවන පාර්ශ්වය එනම් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, පළමු පාර්ශ්වය එනම් ජේ. ආර්. ජයතුංග මහතාගේ ඉල්ලීම බැහැර කිරීමට ඉදිරිපත් කළ කරුණු සලකා බැලීමේ දී මතු දක්වා ඇති කරුණු තුනෙන් (03) එක් කරුණකින් හෝ බැහැර වී ක්‍රියා කළ බව අදාළව සාධාරණ සැකයකින් තොරව ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇත. ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන පහත නිගමන යෝජනා කරමි.

01. 2015.03.01 දින සිට 2017.05.17 දක්වා වූ වර්ෂ 02, මාස 02, දින 01ක කාලයට අදාළ වන පරිදි ප්‍රාදේශීය ධාවන කළමනාකාර තනතුර ආවරණ පත්වීම ස්ථිර පත්වීමක් බවට පත් කොට පත්වීම් ලිපියක් නිකුත් කිරීම, ඒ සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලයට, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කොට අවශ්‍ය අනුමැතිය ලබා ගෙන විධිමත් ලෙස ස්ථිර පත්වීම් ලිපියක් නිකුත් කළ යුතුය. එකී පත්වීම් ලිපියෙහි අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය ගත් දිනය පැහැදිලිව සඳහන් කිරීම අත්‍යවශ්‍යය.

02. ප්‍රාදේශීය ප්‍රධාන ධාවන කළමනාකාර තනතුරට අදාළ III A ශ්‍රේණියේ පිහිටුවීමට අවශ්‍ය අනුමැතිය එකී අධ්‍යක්ෂක මණ්ඩලය පත්‍රිකාවේ සඳහන් කළ යුතුය.

03. එම තනතුරට හිමි වැටුප් තලය පැහැදිලිවම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ සඳහන් කළ යුතුය. එනම් 19480 + 10* 365 + 2*550 = 24,230.00

04. 2015.03.01 දින සිට 2016 ජුනි මස දක්වා ප්‍රධාන ධාවන කළමනාකාර තනතුරට හිමි රු. 5000.00 ක දීමනාව ලබා දිය යුතුය. එම දීමනාව ලබා දීමට අවශ්‍ය අනුමැතිය ඉහත සඳහන් කළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට ඇතුළත් කළ යුතුය.

2024.06.25 දින බේරුම්කරණ අධිකරණයේ දී වගඋත්තරකාර දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබා දුන් වයි. ඩබ්ලිව්. සමන් කුමාර මහතා ප්‍රාදේශීය මුදල් කළමනාකරු ප්‍රාදේශීය ධාවන කළමනාකාර තනතුරට හිමි වැටුප් තලය රු. 19480/- + 10*365 + 2*550 බව තහවුරු කරන ලදි.

ඒ අනුව පළමු පාර්ශ්වය වන ජේ. ආර්. ජයතුංග මහතා ප්‍රාදේශීය ධාවන කළමනාකාරු වශයෙන් තනතුරේ ස්ථිර කොට ආරම්භක වැටුප වන රු. 19480/- + 10*365 + 2*550 පිහිටුවා වැටුප් වර්ධක ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතුය.

පළමු පාර්ශ්වය විසින් 2023.09.19 දින ඉදිරිපත් කළ වැටුප් විස්තරය අනුව ගෙවිය යුතු මුදල මෙසේය.

| | |
|---|---|
| හිඟ වේතනය | රු. 68704.78 |
| හිඟ පාරිතෝෂිකය | රු. 314500.00 |
| හිඟ තනතුරු දීමනාව | රු. 80000.00 |
| එකතුව | රු. 463204.78 |

හිඟ අධිහාරය ලෙස ඉල්ලා ඇති රු. 94,350.00 ක මුදල සඳහා පළමු පාර්ශ්වයට හිමිකමක් නොමැත.

මෙහි සඳහන් මුළු මුදල වන රු. 463,204.78 (රු.හාර ලක්ෂ හැට තුන් දහස් දෙසිය හතරයි ශත හැත්තෑ අටක්) දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් මෙම ප්‍රදානය ගැසට්ගත කිරීමෙන් මසක් ඇතුළත නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට නියම කරමි. අනෙකුත් ව්‍යවස්ථාපිත හිමිකම් සඳහා මෙම ප්‍රදානය බාධාවක් නොවේ.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

**ඒ. එම්. අසංග දයාරත්න,**
බේරුම්කරු.

2025 ජුනි මස 27 වැනි දින.

EOG 07 - 0289

---

මගේ අංකය: IR/COM/01/2023/137.

## කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.08.27 දිනැති හා අංක 2399/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.08.02 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පානදුර, තන්තිරිමුල්ල, කෝන්ගහකොටුව, "චන්දි සෙවන", අංක 385/5 හි පදිංචි ඒ.එම්.ආර්.සී.අත්තනායක මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් බණ්ඩාරගම, කිදෙල්පිටිය, හිරණ තොටුපල පාර, අළුබෝගහවත්ත පිහිටි රිච් කලර් එක්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 44/2024 හා 2025.06.18 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුලි මස 01 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය - IR/COM/01/2023/137.

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය

ඒ. එම්. ආර්. සී. අත්තනායක මිය,
අංක 385/5,
"චන්දි සෙවන", කෝන්ගහ කොටුව,
තන්තිරිමුල්ල,
පානදුර.

නඩු අංකය - A/44/2024

*පළමු පාර්ශ්වය*

රිච් කලර් එක්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අළුබෝගහවත්ත, හිරණ තොටුපල පාර,
කිදෙල්පිටිය,
බණ්ඩාරගම.

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය අනුව ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

මේ සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශ්වය (පළමු පාර්ශ්වය) විසින් කම්කරු දෙපාර්තමේන්තුවේ පානදුර දිස්ත්‍රික් කම්කරු කොමසාරිස් කාර්යාලයට කරන ලද පැමිණිල්ල පිළිබඳව දෙපාර්ශ්වය කැඳවා විභාග කිරීමෙන් පසු අනාවරණය වී ඇති කරුණු පදනම් කරගෙන මෙම ආරාවුල බේරුම්කරණය මගින් විසඳීම සඳහා නියෝජ්‍ය කම්කරු කොමසාරිස් බස්නාහිර කලාප අංක II වෙත ගොනුව සමග ඉදිරිපත් කර ඇත.

ඉක්බිති කාර්මික සම්බන්ධතා අංශය විසින් එම ආරාවුල පිළිබඳව විභාගයක් කරන ලද නමුදු, ඉල්ලුම්කාරිය විසින් අපේක්ෂා කරන ලද පරිදි, ඇයට රැකියාව ලබාදීමට සේවා පක්ෂය එකඟ නොවීම නිසා එම ආරාවුල කම්කරු ආරාවුල් පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව බේරුම්කරණය සඳහා 2023.11.07 දින යොමු කර ඇත.

ඒ අනුව මෙම ආරාවුල බේරුම්කරණය සඳහා අදාළ යොමු කිරීම කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 1R/COM/01/2023/137 අංක යටතේ බේරුම්කරණ අංශයට 2024.07.16 දිනැති ලිපිය මගින් යොමුකර ඇත. එම යොමු කිරීමේ සඳහන් වන ආකාරයට විසඳිය යුතු ආරාවුල ලෙස සඳහන් කර ඇත්තේ,

"රිච් කලර් එකස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හී සේවය කරනු ලැබූ ඒ. එම්. ආර්. සී. අත්තනායක මහත්මියට ලබා දී තිබූ පත්වීම් ලිපියෙහි විශ්‍රාම වයස අවුරුදු 60 ලෙස සඳහන් කර තිබියදී, ඇයව වයස අවුරුදු 50 දී විශ්‍රාම යැවීමෙන් අසාධාරණයක් සිදු තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ".

**බේරුම්කරණය පිළිබඳ පොදු කරුණු**

ඉහත සඳහන් කළ පරිදි මෙම ආරාවුල බේරුම්කරණය සඳහා 2024.09.04 දින ප.ව. 2.00 ට ඉදිරිපත් වන ලෙස කම්කරු කොමසාරිස්වරයා විසින් දෙපාර්ශ්වයට පෙනී සිටින ලෙස දන්වන ලදුව, එදින පළමුවන පාර්ශ්වය වෙනුවෙන් පැමිණිලිකාර ඒ. එම්. ආර්. සී. අත්තනායක මහත්මියම පෙනී සිටි අතර දෙවන පාර්ශ්වය වෙනුවෙන් සහභාගී වූයේ සමාගමේ මානව සම්පත් අංශයේ සේවකයෙකු වූ පසිඳු උමයංග මහතාය.

එදින බේරුම්කරු වශයෙන් මවිසින් පළමුවන පාර්ශ්වයෙන් පත්වීම් සම්බන්ධයෙන් කරුණු කීපයක් විමසන ලද අතර, ඊට පිළිතුරු දෙමින් ඇය ප්‍රකාශ කළේ තමාට පත්වීම් ලිපියක් ලැබී ඇති නමුත් දී ඇති තම පත්වීම ස්ථිර කළ බවට ලිපියක් තමාට එවා නොමැති බවත්, ලැබී ඇති පත්වීම් ලිපියෙහි සඳහන් ආකාරයට විශ්‍රාම ගන්වන වයස අවු. 60 බවත් එහෙත් වයස අවු. 50 දිනයේ දී

තමාගේ සේවය අවසන් කළ බව දන්වමින් ලිපියක් තමාට ලබා දී ඇති බවත්ය.

එසේම මවිසින් දෙවන පාර්ශ්වයෙන් ප්‍රශ්න කීපයක් විමසන ලද අතර ඔහු ප්‍රකාශ කර සිටියේ පත්වීම් ලිපියට අනුව අවුරුදු 50 ත් 55ත් අතර කාලයක් සඳහා ඇයට සේවය කිරීමට හැකියාවක් ඇති බවය.

එම අවස්ථාවේ දී උදයංග මහතාට ආරාවුලට අදාළ කරුණු පිළිබඳ අවබෝධයක් නොතිබූ බව බේරුම්කරුට පෙනී ගිය හෙයින් අදාළ ආරාවුල පිළිබඳව කරුණු ඉදිරිපත් කළ හැකි නිලධාරියෙක් ඉදිරි පරීක්‍ෂණ සැසිවලට එවීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලද අතර, දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද පත්වීම් ලිපි දෙකෙහි ඇති විශ්‍රාම යන වයස සම්බන්ධයෙන් දක්නට ලැබෙන වෙනසට හේතු වූ කරුණු ඉදිරිපත් කිරීමට සූදානම්ව පැමිණෙන ලෙස ද, දන්වන ලදී. ඉක්බිති ඒ සම්බන්ධයෙන් වැඩිදුර විභාගය සඳහා දින නියම කර ගනිමින් පරීක්ෂණය කල් තබන ලදී.

ඒ අනුව පළමුවන පාර්ශ්වය, ඊළඟ සැසියේ සිට, පැමිණිල්ල නියෝජනය කිරීම සඳහා ස්ටැන්ලි හෙට්ටිආරච්චි මහතා සහභාගි කරවීමට පියවර ගෙන තිබූ අතර, දෙවන පාර්ශ්වය නියෝජනය කිරීම සඳහා, සමාගමේ සාමාන්‍යාධිකාරී එම්. එච්. යූ. මදුරසිංහ මහතා එවීමට කටයුතු කරන බව දන්වා එවා තිබුණි. එසේ වුවද දෙවන පාර්ශ්වය වෙනුවෙන් දිගටම සහභාගි වූයේ සමාගමේ මානව සම්පත් අංශයේ සේවකයෙකු වූ පසිඳු උමයංග මහතාමය.

2024.10.24 දින විභාගයට පාර්ශ්වකරුවන් කැඳ වූ අවස්ථාවේ දෙවන පාර්ශ්වය නියෝජනය කරමින් පසිදු උමයංග මහතා විසින් ප්‍රකාශ කළේ, අත්තනායක මහත්මිය වෙත සමාගම විසින් නිකුත් කරන බව පවසමින් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද පත්වීම් ලිපිය තම සමාගම විසින් නිකුත් කරන ලද ලිපියක් බව තමන් පිළිගන්නා බවත්, සමාගමේ ගොනුව අනුව අත්තනායක මහත්මියට සමාගම විසින් නිකුත් කරන ලද පත්වීම් ලිපියෙහි අත්සන් කර ඇත්තේ, එවකට මානව සම්පත් කළමනාකරු වශයෙන් සේවය කළ අය විසින් බවත්, ඔහුගේ නම තමා නොදන්නා බවත්ය. පළමුවන පාර්ශ්වයේ සැබැවින්ම ප්‍රශ්නගත ආරාවුලේ පදනම වී ඇත්තේ පළමුවන පාර්ශ්වකරු වෙත සමාගම විසින් නිකුත් කරන ලද බවට සඳහන් කරමින් එකිනෙක පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද පත්වීම් ලිපියෙහි සඳහන් විශ්‍රාම ගැන්වීමේ වයස, එකිනෙකට වෙනස්වී තිබීමය. එහෙයින් 2024.10.24 දින බේරුම්කරු අදාළ විභාගය අවසන් කර දෙපාර්ශ්වයට දන්වන ලද්දේ ලිඛිත දේශන 2024.11.20 ට පෙර එවන ලෙසය.

දෙවන පාර්ශ්වය මෙම මූලික විරෝධතා ඉදිරිපත් කළ යුතුව තිබුණේ විභාගය ආරම්භයේදී වුවද, දෙවන පාර්ශ්වය එය ඉදිරිපත් කර ඇත්තේ පරීක්‍ෂණය අවසන් කිරීමෙන් පසු ලිඛිත දේශනය මගින්ය. කෙසේ වෙතත් එකී මූලික විරෝධතා පිළිබඳව බේරුම්කරු විසින් තම අවධානය යොමු කොට සලකා බැලීමට තීරණය කරන ලදී.

**4.0 මූලික විරෝධතා පිළිබඳව විමසීම.**

දෙවන පාර්ශ්වය විසින් ලිඛිත දේශනය මගින් ඉදිරිපත් කර ඇති මූලික විරෝධතා දෙක මෙසේය.

(1) පළමුවන පාර්ශ්වය තම ඉල්ලීම ප්‍රමාද වී ඉදිරිපත් කර ඇති බව
(2) පළමුවන පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර සජීවී ආරාවුලක් නොමැති බව

**(1) පළමුවන පාර්ශ්වය තම අයිතිවාසිකම් ඉල්ලීමේදී ප්‍රමාද වී ඉල්ලා ඇති බව. (Delay Defeets Eqity)**

දෙවන පාර්ශ්වය විසින් තම පළමුවන මූලික විරෝධතාව මගින් ප්‍රකාශ කර ඇත්තේ පළමුවන පාර්ශ්වය තම ඉල්ලීම අංක 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 31(අ) වගන්තිය ප්‍රකාරව නියමිත කාලය (මාස හයක්) තුළ ඉදිරිපත් නොකොට, (The first party has slept on his right) වසර හතරකට පසු එම ඉල්ලීම ඉදිරිපත් කිරීම මගින් සාධාරණත්ව නීතියේ මූලධර්මයක් වන "සාධාරණත්වය පතන්නා නොපමාව කටයුතු කළයුතු බව" ට වන මූලධර්ම පළමුවන පාර්ශ්වයට එරෙහිව ක්‍රියාත්මක වන බවත් එසේ හෙයින් පළමුවන පාර්ශ්වයට ප්‍රස්තුත ආරාවුල සම්බන්ධයෙන් ඉල්ලීමක් කිරීමට කිසිදු නෛතික අයිතිවාසිකමක් නොමැති බවත්ය.

**(2) දෙපාර්ශ්වය අතර සජීවී ආරාවුලක් නොමැති බව.**

දෙවන පාර්ශ්වය විසින් ලිඛිත දේශනය මගින් ඉදිරිපත් කර ඇති දෙවන මූලික විරෝධතාව වන්නේ දෙපාර්ශ්වය අතර සජීවී ආරාවුලක් නොමැති බවය.

ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර ඇත්තේ, "Section 04 of the industrial Disputes Act No. 43 of 1950 sets out" (1) the minister may, if he is of the opinion that an industrial dispute is a miner dispute, refer, it by an order in writing, for settlement by arbitration to an aarbitrator appointed by the Minister or to a labour tribunal, not with standing that the parties to such dispute or thier representatives do not consent to such reference"

යනුවෙන් සඳහන් වන බවත් ඒ අනුව මෙම ආරාවුල "වලංගු යොමු කිරීමක්" නොවන බවත් "වලංගු යොමු කිරීමක්" වීමට නම් ආරාවුලක් "industrial dispute is a miner dispute" එකක් ලෙස සංස්ථාපනය විය යුතු බවත්. ඒ සම්බන්ධයෙන් The State Bank of India Vs Sundaralingam (1971) 73 NLR 514 දරන නඩු තීන්දුවේ ද An Griendlays Bank Vs Ministry of labour and others (1995) 2 SLR 53 නඩු තීන්දුවේ ද Perera Vs Standard Charterd Bank (1995) 1 SLR 73 නඩු තීන්දුවේ ද Ceylon Bank Employees Vs. Yatawara (1964) NLR 49,56,57. නඩු තීන්දුවේ ද සඳහන් කරුණු මගින් තහවුරු කර ඇති බවත්ය.

තවදුරටත් කරුණු දක්වමින් දෙවන පාර්ශ්වය සඳහන් කරන්නේ දෙවන පාර්ශ්වය විසින් පළමුවන පාර්ශ්වය වෙත නිකුත් කර ඇති පත්වීම් ලිපිය අනුව, පළමුවන පාර්ශ්වකරුගේ වයස අවුරුදු 50 වන දිනයේදී දෙවන පාර්ශ්වය විසින් ඇය විශ්‍රාම ගන්වා ඇති බවත්, ඒ බව පළමුවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති (R 1a) ලිපියෙහි "2020 දෙසැම්බර් මස 08 වන දින වනවිට මාගේ ආයුකාලය අවුරුදු පනහක් (50) සම්පූර්ණවීම නිසා ආයතනයේ නීතිමය ක්‍රියාපටිපාටිය අනුව සේවයෙන් විශ්‍රාම යායුතුව ඇත. එහෙත් තවත් කෙටි කාලයකින් මෙම ආයතනයට මාගේ ශ්‍රම දායකත්වය ලබාදීමට උපරිම හැකියාව සහ උත්සාහය පවතින බැවින්, ඒ ගැන සළකා බලා මා හට තව කෙටිකාලයක් සේවය කිරීමට අනුමැතිය ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි" යනුවෙන් සඳහන් කර ඇති බවත්, පළමුවන පාර්ශ්වය ඉදිරිපත් කර ඇති පත්වීම් ලිපියෙහි (R 1(b) දෙවන පාර්ශ්වය විසින් හබ කර නැති බවත්, ඒ අනුව දෙවන පාර්ශ්වය විසින් 2020.12.08 දින සිට පළමුවන පාර්ශ්වය විශ්‍රාම ගන්වා ඇති බව නීත්‍යානුකූල බවට පිළි ගෙන ඇති බවත් එහෙයින් එකී විශ්‍රාම ගැන්වීම පළමුවන පාර්ශ්වයට ආරාවුලකට තරම් කරුණු ස්ථාපනය වී නොමැති බවත්ය.

**මූලික විරෝධතා පිළිබඳව බේරුම්කරුගේ නිරීක්ෂණ හා නිගමන.**

**(1) ප්‍රමාද වී ඉල්ලීම කර ඇති බව.**

දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති විරෝධතා දෙකෙන් පළමුවන විරෝධතාවය වන්නේ නියමිත කාලය තුළ පළමුවන පාර්ශ්වකරු සිය ඉල්ලීම සිදුකර නොමැති හෙයින්, එයට සාධාරණත්ව නීතියෙහි සඳහන් වන Delay defeets equity යන මූලධර්මය ව්‍යතිරේකයක් වශයෙන් අදාළ වන බවය.

2013.10.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිෂ්පාදන සහායිකාවක් ලෙස සේවයට බඳවාගෙන ඇති අතර, එම පත්වීම් ලිපිය 2012.10.02 දින තමන් භාරගත් බවත් ඇය 2014.04.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි, සේවය ස්ථිර කර ඇති බවත්. එම පත්වීම් ලිපියේ සඳහන් වන ආකාරයට, පළමුවන පාර්ශ්වකරුගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනයේදී ඇය විශ්‍රාම ගැන්විය යුතු බවත්, එහෙත් 2020.12.07 දිනැති ලිපිය මගින් 2020.12.08 දින සිට සේවයෙන් තමා විශ්‍රාම ගන්වන බව, දන්වා ඇති බවත්ය.

ඒ සම්බන්ධයෙන් අනාවරණය වූ කරුණු අනුව පෙනී යන්නේ, පළමුවන පාර්ශ්වකරු විසින් මුලින්ම කම්කරු කොමසාරිස් වෙත පැමිණිල්ලක් කර ඇත්තේ 2022.10.04 දිනයේදී බවත් එනම් නියමිත කාලය වන මාස හයක් ඇතුළත පැමිණිල්ල ඉදිරිපත් නොකොට වසරකුත් මාස දහයකට ආසන්න කාලයක් ගතවූ පසුව එය ඉදිරිපත් කර ඇති බවය. ඒ සම්බන්ධයෙන් පළමුවන පාර්ශ්වකරු විසින් බේරුම්කරණය සඳහා එවන ලද දෙවන ප්‍රකාශයෙහි කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ 2020.12.08 දින සිට සේවයෙන් විශ්‍රාම ගන්වන බව, දන්වමින් 2020.12.07 දිනැති ලිපිය සම්බන්ධයෙන් දිගින් දිගටම දුරකථනය මගින් වරින්වර මානව සම්පත් කළමනාකරුගෙන් විමසීම් කළ බවත් ඒ සෑම අවස්ථාවකම තමා නැවත සේවයට ගන්නා බවට දුරකථනය මගින් වාචිකව පොරොන්දු වූ බවත් දින මාස ගතවෙද්දී දුරකථනයෙන් කථා කිරීම පවා මගහැරි බවත් ඉන් පසුව 2022.10.04 දින පානදුර කම්කරු කාර්යාලයට පැමිණ පැමිණිල්ලක් කළ බවත්ය.

මෙම ප්‍රකාශය සනාථ කිරීම සඳහා පළමුවන පාර්ශ්වකරුට නොහැකි නමුත් පවත්නා කාර්මික සංස්කෘතික පරිචය (Industrial cultural practice) අනුව සේවකයෙකු විසින් පැමිණිල්ලක් කළයුතු කාලය ඉක්මවන තුරු ප්‍රශ්නය යටපත් කර ගෙන සිටීම (Hide under the carpet) ප්‍රචලිතව දක්නට ලැබෙන කරුණකි. පළමුවන පාර්ශ්වකරු නිශ්චිතව සඳහන් කල කරුණක් වන්නේ "... මෙය මගෙන් පුද්ගලිකව පලිගැනීමක් සේ හැඟී යන" බවය. ඊට අමතරව දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති ව්‍යාජ බවට සැක සිතෙන ලිපි දෙක, එනම් (R1) සහ (R2) යනුවෙන් සඳහන් ලිපි දෙකද සැළකිල්ලට ගන්නා විට පළමුවන පාර්ශ්වකරු සඳහන් කර ඇති පරිදි "මෙය මගෙන් පුද්ගලිකව පලිගැනීමක් සේ හැඟී යන" බවට කර ඇති ප්‍රකාශය තහවුරු වේ.

කටයුතු අපේක්ෂාවෙන් කම්කරු කොමසාරිස් වරයාට අභියාචනයක් කර ඇති දිනය ලෙස පෙනී යන්නේ 2022.10.04 වන දිනයයි. ඒ වන විට පළමුවන පාර්ශ්වකරු සේවයෙන් විශ්‍රාම ගන්වා වසරකුත් මාස එකොළහක් ගතවී ඇත. කම්කරු ආරාවුල් පනතේ විධිවිධාන අනුව මාස 6 ක් ඇතුලත කොමසාරිස් වරයාට ඉල්ලීම් කළයුතුව ඇත. ඒ පිළිබඳව පානදුර සහකාර කම්කරු කොමසාරිස්වරයා විසින් කරන ලද පරීක්ෂණයේදී නියමිත දිනය ඉක්මවා ඇති බවට දෙවන පාර්ශ්වය විසින් විරෝධතාවක් ඉදිරිපත් කර නැත. එබැවින් පානදුර සහකාර කම්කරු කොමසාරිස් වරයා විසින් එය සමථකරණය සඳහා කටයුතු ආරම්භ කරන ලද අතර සමථකරණය සඳහා දෙපාර්ශ්වයම එකග නොවීම නිසා එය කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමු කර ඇත.

ඒ පිළිබඳව වැඩිදුරටත් කරුණු සලකා බැලීම සඳහා කම්කරු කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්මික සම්බන්ධතා අංශය විසින් දෙපාර්ශ්වයම කැඳවා ඇති අවස්ථාවේදී හෝ පැමිණිලිකාරියට රැකියාව ලබාදීමට නොහැකි නම්, ලිඛිත දේශන ඉදිරිපත් කරන ලෙස දන්වන ලද අවස්ථාවේ දී හෝ දෙවන පාර්ශ්වය එකී ප්‍රමාදය පිළිබඳ විරෝධතාවක් ඉදිරිපත් කර නැත. ඒ වෙනුවට ඉදිරියට ආයතනයේ සුදුසු ඇබෑර්තුවක් ඇති වූවහොත්, ඇය හට ප්‍රමුඛස්ථානය දීමට කටයුතු කරන බවට එකඟ වී ඇත.

එසේම ඒ පිළිබඳ පානදුර සහකාර කම්කරු කොමසාරිස්වරයා ද පළමු පාර්ශ්වකරු විසින් තම පැමිණිල්ල කර ඇත්තේ නියමිත දිනය ඉක්මවා බව සඳහන් කරමින් පළමු පාර්ශ්වකරු ගේ පැමිණිල්ල ප්‍රතික්ෂේප කර නැත. එබැවින් බේරුම්කරණය කරන අවස්ථාවේදී දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ල ප්‍රමාදවී ඉදිරිපත් කළ බවට දක්වන විරෝධතාවය බේරුම්කරු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
ඒ අනුව මාස හයක් ඇතුළත පැමිණිල්ලක් නොකොට වසරකුත් මාස එකොළහකට ආසන්න කාලයක් ගතවූ පසුව පැමිණිල්ලක් කිරීම සාධාරණත්ව නීතියෙහි සඳහන් වන Delay defeets equity යන මූලධර්මය ව්‍යතිරේකයක් වශයෙන් අදාළ වන බවට දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති විරෝධතාව පිළි ගැනීමට බේරුම්කරු මැළි වෙයි.

**(2) පළමුවන පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර සජීවී ආරාවුලක් නොමැති බව.**

දෙවන පාර්ශ්වය විසින් දෙවන ප්‍රකාශය සමග ඉදිරිපත් කර ඇති, පළමුවන පාර්ශ්වකරු වෙත නිකුත් කර ඇති පත්වීම් ලිපිය(R1) නිර්ව්‍යාජ පත්වීම් ලිපිය ලෙස පිළිගන්නේ නම්, ඇය විශ්‍රාම ගැන්වීම කළයුතු දිනය වන්නේ (ඇයගේ උපන් දිනය අනුව) 2030.12.08 වන දිනයේදීය. එහෙත් ඇය 2020.12.08 දින සිට විශ්‍රාම ගන්වන බව දන්වමින් ලිපිය යවා ඇත්තේ 2020.12.07 දිනයේදීය.

පුද්ගලික අංශයේ සේවකයෙකුට විශ්‍රාම ගැන්වීමේ ලිපියක් යැවිය යුතු දිනයක් සඳහන් වන නීතියක් දක්නට නොලැබෙන නමුත්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවකයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මකවන රෙගුලාසි සංග්‍රහය වන ආයතන සංග්‍රහයෙහි සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවල විශ්‍රාම ගැන්වීමේ දිනය ලෙස, වයස අවුරුදු 60 බවත් විශ්‍රාම ගැන්වීමේ නියමිත වයසට එළඹීමේදී සේවකයා විසින් ඒ බව හයමසකට පෙර තම සේවා යෝජකයාට දැනුම්දීමක් කළ යුතු බවත් සඳහන් වේ.

එය ඒ ආකාරයෙන්ම පුද්ගලික අංශයේ සේවකයෙකු සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවන නමුත් තම සේවකයා විශ්‍රාම ගැන්වීමේ නියමිත වයසට එළඹීමේදී සේවකයා සාධාරණ කාලයක් තුළ අවම වශයෙන් මාසයකට පෙරවත් දැනුම් දීමේ වගකීමක් සේවායෝජකයෙකු වෙත පැවරෙන බව බේරුම්කරු පිළි ගනී. එපමණක් නොව රාජ්‍ය සේවකයෙකු මෙන්ම පුද්ගලික අංශයේ සේවකයෙකු ද විනය පරීක්ෂණයකින් තොරව සේවයෙන් ඉවත් කරන්නේ නම් මසකට පෙර දැන්විය යුතු බවට, නීතිමය විධිවිධානයක් රාජ්‍ය අංශයේ මෙන්ම පුද්ගලික අංශයේද දක්නට ලැබේ. ඒ ආකාරයෙන් දැනුම්දීමක් නොකොට විශ්‍රාම ගැන්වීමට නියමිත දිනට පෙර දින කරනු ලබන කෙටි දැන්වීමකින් සේවකයෙකු විශ්‍රාම ගන්වන බව දැන්වීම, සේවකයාට කරන බලවත් අගතියක් බව බැලූ බැල්මට පෙනී යයි.

2021 අංක 28 දරන සේවකයින් විශ්‍රාම යාමේ වයස පනත අනුව විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 විය යුතු බව එම පනතේ (2) වගන්තියේ සඳහන් වේ.

බේරුම්කරණයේදී ඉදිරිපත් වූ ලිපි ලේඛන අනුව, පළමුවන පාර්ශ්වකරු විසින් තමා විශ්‍රාම ගැන්වීම පිළිබඳව ලිපියක් (දින රහිත) දෙවන පාර්ශ්වකරු වෙත ඉදිරිපත් කර ඇති බවට තහවුරු කරමින් ලේඛනයක් දෙවන පාර්ශ්වකරු විසින් ඉදිරිපත් කර ඇති අතර, දෙවන පාර්ශ්වකරු ද, පළමුවන පාර්ශ්වකරු විසින් නැවත සේවය ඉල්ලා සිටි බව සඳහන් කර ඇති බව සනාථ කරමින් 2020.12.10 දිනැතිව ලිපියක් (R2) හා (R2b) ඉදිරිපත් කර ඇත. එම ලිපි දෙකෙන් දෙවන පාර්ශ්වකරු ඉදිරිපත් කර ඇති ලිපියේ පළමුවන පාර්ශ්වකරු වශයෙන් සඳහන් කරමින් තබා ඇති අත්සන පළමුවන පාර්ශ්වකරු විසින් බේරුම්කරණයේදී ඉදිරිපත් කර ඇති සෙසු ලිපිවල දැක්වෙන ඇයගේ අත්සන හා සසඳා බලන විට හාත්පසින්ම වෙනස් බව පෙනී යයි. ඒ අනුව දෙවන පාර්ශ්වකරු වෙත ඉදිරිපත් කර ඇති බවට තහවුරු කරමින් දෙවන පාර්ශ්වකරු විසින් බේරුම්කරණයේදී ඉදිරිපත් කර ඇති පළමුවන පාර්ශ්වකරු විසින් නැවත සේවය ඉල්ලමින් තමන් වෙත එවන ලදැයි සඳහන් කරඇති ලිපිය (R2) නිර්ව්‍යාජ ලිපියක්ද යන්න පිලිබඳව සැක පහළ වෙයි. එනයින්ම එම ලිපියේ අන්තර් ගත කරුණු පිළිබඳව ද සැකයක් උපදවයි. කෙසේ වෙතත්, පළමුවන පාර්ශ්වකරු විසින් තමන් නැවත සේවයේ පිහිටුවීමට යම් ඉල්ලීමක් කර ඇති බව බේරුම්කරු පිළිගනී.

දෙවන පාර්ශ්වය විසින් පළමුවන පාර්ශ්වකරු වෙත යවා ඇති පත්වීම් ලිපිය ලෙස දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති ලිපියෙහි (R1) ඇය විශ්‍රාම ගැන්වීම කළයුතු දිනය වයස අවුරුදු 50 ලෙස සඳහන් වූවද පළමුවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති පත්වීම් ලිපියෙහි විශ්‍රාම වයස අවුරුදු 60 ලෙස සඳහන් වේ.

දෙවන පාර්ශ්වය ඒ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ලිඛිත දේශනයෙහි සඳහන් කර ඇත්තේ, පළමුවන පාර්ශ්වකරුට පත්වීම් ලිපිය දෙනු ලැබූ 2013 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ පුද්ගලික අංශයේ සේවකයින්ගේ විශ්‍රාම ගන්වන වයස පිරිමි වයස අවුරුදු

55 ක් ලෙසද, ගැහැණු වයස අවුරුදු 50 ක් ලෙස සම්මත වී තිබූ බවය. එහෙත් එම කරුණ සනාථ කිරීම සඳහා කිසිදු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් කර නැත.

ඒ සම්බන්ධයෙන් කරුණු දක්වමින් පළමුවන පාර්ශ්වය තම දෙවන ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ, තමාට මෙන්ම එම වකවානුවේ තමා සමග පත්වීම් ලබා ඇති පානදුර, හිරණ, ගහබඩ පාර, අංක 110/1 ලිපිනයෙහි පදිංචි, ඩබ්ලිව්. ශ්‍රියාණි සහ වැල්මිල්ල, කිඳෙල්පිටිය හන්දිය, ගඟ පාර, අංක 271/5 ලිපිනයෙහි පදිංචි කේ. කේ. කේ. ලසිකා යන සේවිකාවන්ගේ පත්වීම් ලිපිවලද, විශ්‍රාම ගැන්වීම කළයුතු දිනය ලෙස සඳහන් වන්නේ වයස අවුරුදු 60 බවත් ය. ඒ බව සනාථ කිරීම සඳහා එම සේවිකාවන්ගේ පත්වීම් ලිපිවල සහතික කළ පිටපත් දෙකක් සමඟ දිවුරුම් පෙත්සම් දෙකක් ද ඉදිරිපත් කර ඇත.

දෙවන පාර්ශ්වය සඳහන් කර ඇති පරිදි 2013 වර්ෂය වන විට පුද්ගලික අංශයේ සේවකයන් විශ්‍රාම ගන්වන දිනයක් සඳහන් නීතිමය විධිවිධානයක් නොතිබූ අතර සේවකයන්ගේ අර්ථසාධක අරමුදල ලබා ගැනීම සඳහා සේවකයන් කළ යුතු සේවා කාලය පිරිමි වයස අවුරුදු 55ක් ලෙසද ගැහැණු වයස අවුරුදු 50ක් ලෙස ද අර්ථසාධක අරමුදල් පනතේ සඳහන්ව තිබිණ.

2013.10.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයට බඳවා ගැනීමට තීරණය කර ඇති අතර, සේවයෙන් විශ්‍රාම ගන්වන දිනය ලෙස සඳහන් වන්නේ වයස අවුරුදු 50 සම්පූර්ණ වූ විට කාන්තාවන්ද, වයස අවුරුදු 55 සම්පූර්ණ කළ විට පුරුෂයන්ද විශ්‍රාම ගන්වන බවය. ලිපි දෙකෙහිම මානව සම්පත් කළමනාකරු අත්සන් කර ඇති නමුත්, පළමුවන පාර්ශ්වය ඉදිරිපත් කර ඇති ලිපියේ ඔහු 2013.10.02 දිනය සඳහන් කර අත්සන් කර ඇති අතර, දෙවන පාර්ශ්වය ඉදිරිපත් කර ඇති පත්වීම් ලිපියෙහි දිනයක් සඳහන් කර නැත. එමෙන්ම ලිපියෙහි සඳහන් පළමුවන පාර්ශ්වකරුගේ නමද වෙනස් බව පෙනීයයි. පත්වීම් භාර ගත් බවට පළමුවන පාර්ශ්වය ඉදිරිපත් කළ ලිපියේ මුල් පිටපතම දෙවන පාර්ශ්වය ඉදිරිපත් කර ඇති අතර, පළමුවන පාර්ශ්වය එහි ඡායාස්ථිත පිටපත ඉදිරිපත් කර ඇත. (එම ලිපි දෙකේ එම කරුණෙහි වෙනසක් දක්නට නැත.)

පළමුවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද, දෙවන පාර්ශ්වය විසින් තමන් විශ්‍රාම ගන්වමින් තමන් වෙත එවන ලද ලිපියෙහි මුල් පිටපත දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති එම ලිපියේ කාර්යාල පිටපත අතර වෙනසක් දක්නට නැත.

නැවත සේවය කිරීම සඳහා කර ඇති ඉල්ලීම් පළමුවන පාර්ශ්වය විසින් දෙවන පාර්ශ්වය වෙත (R2) යවන ලද ලිපියෙහි මුල් පිටපත ලෙස සඳහන් කරමින් දෙවන පාර්ශ්වය වෙත විසින් ඉදිරිපත් කරන ලද ලිපියෙහි පළමුවන පාර්ශ්වකරුගේ අත්සන ලෙස සඳහන් තබා ඇති අත්සන පළමුවන පාර්ශ්වකරුගේ නොවන බවට බේරුම්කරු නිරීක්ෂණය කරන ලදී.

විශේෂයෙන්ම පත්වීම් ලිපියේ ඇති (දෙවන පාර්ශ්වය ඉදිරිපත් කර ඇති එකිනෙකට වෙනස් වූ) වෙනස්කම් පිළිබඳව බේරුම්කරු නිරීක්ෂණය කරන ලද අතර, බැලූ බැල්මට දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද පත්වීම් ලිපියේ (R1) අන්තර්ගත කරුණු වල ඇති වෙනස්කම් මෙන්ම, ලිපියෙහි ව්‍යුහයද සැලකිල්ලට ගන්නා විට එය ව්‍යාජ ලිපියක් දෝ යන සැකය බේරුම්කරු නිරීක්ෂණය කරන ලදී.

එසේම දෙවන පාර්ශ්වය විසින් බේරුම්කරුට ඉදිරිපත් කරන ලද පත්වීම්ලිපියේ අංක 15.9 කොන්දේසිය සහ අංක 16 කොන්දේසිය වශයෙන් සඳහන් පේළි අතර ඇති පරතරය, පළමුවන පාර්ශ්වය විසින් බේරුම්කරුට ඉදිරිපත් කරන ලද පත්වීම් ලිපියේ කොන්දේසි අංක 15.9 වගන්තිය සහ 16 වගන්තිය සඳහන් පේළි අතර ඇති පරතරයට වඩා බෙහෙවින් දුරස් වේ.

තවද, ලිපිය අත්සන් කර ඇති ස්ථානයේ වචන භාවිතා කර ඇති ආකාරය, අත්සන සහ දිනය නිරීක්ෂණය කරන විට පෙනී යන්නේ, දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති පත්වීම් ලිපියට වඩා පළමුවන පාර්ශ්වය ඉදිරිපත් කර ඇති ලිපිය වඩාත් නිවැරදි හා නිර්ව්‍යාජ ලිපියක් බවය.

ඒ අනුව, පළමුවන පාර්ශ්වකරු විසින් ඉදිරිපත් කරන ලද පත්වීම් ලිපියට වඩා වෙනස් වූ පත්වීම් ලිපියක් දෙවන පාර්ශ්වකරු විසින් ඉදිරිපත් කර ඇති බැවින්, විශේෂයෙන්ම විශ්‍රාම ගැන්වීමේ වයස ලෙස සඳහන් දිනය වයස අවුරුදු 50 සම්පූර්ණ වූ දිනය ලෙස සඳහන් කර තිබීම නිසා සැබැවින්ම විශ්‍රාම ගැන්වීමේ දිනය 2020.12.08 දින ද නැතහොත්, 2030.12.08 දින ද යන්න පිළිබඳව ගැටලුවක් පැන නගී.

ඉහත සඳහන් වන පරිදි බැලූ බැල්මට පළමුවන පාර්ශ්වකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපිය නිර්ව්‍යාජ පත්වීම් ලිපියක් බව බේරුම්කරු විසින් පිළිගන්නා බැවින් විශ්‍රාම ගැන්වීමේ දිනය 2030.12.08 දින බව බේරුම්කරු විසින් නිරීක්ෂණය කරනු ලැබේ.

එනයින් සළකා බලන විට එනම් පළමුවන පාර්ශ්වකරු විශ්‍රාම ගැන්විය යුතු දිනය 2030.12.08 ලෙස තීරණය කළ යුතුව තිබියදී 2020.12.08 දින විශ්‍රාම ගැන්වීම නිසා පළමුවන පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර සජීවී ආරාවුලක් පවතින බව, බේරුම්කරු විසින් නිරීක්ෂණය කරයි.

**අනාවරණය වූ කරුණු**

පළමුවන පාර්ශ්වකරු මෙම බේරුම්කරණයේදී පළමුවන ප්‍රකාශයක් සිදුකර නොමැති අතර, ඇය විසින් පානදුර කම්කරු කාර්යාලයට ඉදිරිපත් කරන ලද 2022.10.04 දාතම දරන පැමිණිල්ල පළමුවන ප්‍රකාශය ලෙස බේරුම්කරණයේදී සැලකිල්ලට ගන්නා ලදී.

එම පැමිණිල්ල මගින් පළමුවන පාර්ශ්වකරු ප්‍රකාශ කර ඇත්තේ තමා "රිච් කලර් එක්ස්පෝර්ට් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ සේවා අංක 502 යටතේ, 2013.10.02 දින සේවයට බැඳී ඇති බවත්, ඇඳුම් වියලුම් අංශයේ පාලිකාව ලෙස සේවය කර ඇති බවත්, 2020.12.07 දිනැතිව ආයතනය විසින් තමා වෙත එවන ලද ලිපිය මගින් තම සේවය අවසන් කළ බවත්, සේවය අවසන් කරන විට රු. 35,000/- ක වැටුපක් ලැබූ බවත්, ඒ වනවිට එම ආයතනයේ සේවකයන් 800 ක් පමණ සේවය කළ බවත්, තමාට ලබාදී තිබූ පත්වීම් ලිපිය අනුව, වයස අවුරුදු 60 දක්වා සේවය කළ හැකි බව දන්වා තිබුණත් තම වයස අවුරුදු 50 සම්පූර්ණවීමත් සමගම තම සේවය අවසන් කළ බවත්, තම සේවය අවසන් කිරීම පිළිබඳව ආයතනයේ අධිපතිතුමා ගෙන් විමසූ බවත්, ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු බවත්, එහෙයින් තමාට නැවත සේවය ලබාදෙන ලෙස ඉල්ලමින් 2022.10.04 දින පානදුර කම්කරු කාර්යාලයට පැමිණිල්ලක් කළ බවත්‍ය.

දෙවන පාර්ශ්වකරු, 2024.09.04 දිනැතිව තම පළමුවන ප්‍රකාශය ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, පළමුවන පාර්ශ්වකරු 2013.10.02 දින සේවයට බැඳී ඇති බවත්, ඇයට 2013.10.02 දිනැතිව ලබාදෙන ලද පත්වීම් ලිපිය ඇය විසින් අත්සන් කර භාරගෙන ඇති බවත්, ඇය 2014.04.02 දිනයේ සිට නිෂ්පාදන සහායක තනතුරේ ස්ථිර කර ඇති බවත්, පත්වීම් ලිපියේ 16 වගන්තිය ප්‍රකාරව ඇයගේ වයස අවුරුදු 50 සම්පූර්ණවීම හේතු කොටගෙන, 2020.12.08 දින සිට සේවයෙන් විශ්‍රාම ගන්වා ඇති බවත්‍ය.

දෙවන පාර්ශ්වකරු තම පළමුවන ප්‍රකාශය මගින් තව දුරටත් සඳහන් කර ඇත්තේ, පළමුවන පාර්ශ්වකරු විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වකරු වෙත ලිපියක් එවමින් ඇයට කෙටිකාලයක් නැවත සේවය කිරීමට අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා ඇති නමුත්, එම ලිපියෙහි වසර 60 දක්වා සේවය කිරීම සඳහා ඉල්ලීමක් කර නැති බවත්, ඇය විශ්‍රාම ගැන්වූ 2020.12.08 දින සිට වසර එක හමාරකටත් වැඩි කාලයක් ගතවීමෙන් පසුව, ඇය විසින් තමා කම්කරු රීති උල්ලංඝනය කර ඇති බවට සඳහන් කරමින් 2022.10.04 දිනැතිව කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, පළමුවන පාර්ශ්වකරු තම පැමිණිල්ල සමග ඉදිරිපත් කර ඇති ඇයගේ පත්වීම් ලිපියේ මුල් පිටපත තම ආයතනය විසින් නිකුත්කර ඇති පත්වීම් ලිපිය හා පරස්පර බවත්, ආයතනය විසින් නිකුත් කරන ලද පත්වීම් ලිපියේ කොන්දේසි අනුව ඇය වයස අවුරුදු 50 සම්පූර්ණ වීමෙන් පසු ඇයව විශ්‍රාම ගැන්වීම නීත්‍යානුකූල බවත්‍ය.

බේරුම්කරුගේ දැන්වීම පරිදි දෙවන පාර්ශ්වය විසින් දින රහිතව ඉදිරිපත් කර ඇති තම ලිඛිත දේශනය බේරුම්කරණ හා කාර්මික අධිකරණ අංශය වෙත 2024.12.16 දින ලැබී ඇති බව වාර්තා විය. දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති එම ලිඛිත දේශනයෙහි ප්‍රස්තුත ආරාවුලට අදාළවන කරුනු මෙන්ම, බේරුම්කරණයට යොමු කිරීම හා බේරුම්කරණයට භාජනය කිරීම යන සංසිද්ධීන් පිළිබඳ මූලික විරෝධතා දෙකක් පිළිබඳව කරුණු ද ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, නියමිත කාලය තුළ අභියාචනයක් ඉදිරිපත් කර නොමැති බවත්, අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තේ වසර හතරක් ඉක්ම වූ පසු බවත් එම ප්‍රමාදය හේතු කොට ගෙන කාර්මික ආරාවුල් පනත යටතේ පළමුවන පාර්ශ්වකරු ඉදිරිපත් කර ඇති අභියාචනය බේරුම්කරණය සඳහා විභාගයට ගත නොහැකි වන තරමේ ප්‍රමාදයක් බවත්, එමෙන්ම ඉදිරිපත් වී ඇති ආරාවුල විභාග කිරීමට තරම් සජීවී ආරාවුලක් එහි නොමැති බවත්‍ය.

තව දුරටත් දෙවන පාර්ශ්වකරු සඳහන් කර ඇත්තේ පළමුවන පාර්ශ්වකරු විසින් ඉදිරිපත් කර ඇති මෙම පත්වීම් ලිපිය පිළිබඳව තමන් නොදන්නා බවත් දෙවන පාර්ශ්වය විසින් කම්කරු අමාත්‍යාංශයේ කාර්මික සබඳතා අංශයේදී පැවැති සමථකරණයේදී 2023.10.18 දින සඳහන් කර ඇති අතර, බේරුම්කරණයේදී ඉදිරිපත් කරන ලද දින රහිත ලිඛිත සැලකිරීම්වල සඳහන් කර ඇත්තේ පළමුවන පාර්ශවය ඉදිරිපත් කර ඇති ව්‍යාජ ලේඛනයක් බවය.

මේ සම්බන්ධයෙන් පළමුවන පාර්ශවකරු 2024.09.24 දිනැතිව ලිඛිත දේශන ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ තමා වයස අවුරුදු (50) පනහ සම්පූර්ණ වන දිනය වන 2020.12.08 දින සිට තමා විශ්‍රාම ගන්වන බව දන්වමින් තමාට ලිපියක් එවා ඇත්තේ 2020.12.07 දින බවත්, එසේ වුවද තමා සමඟ සේවයට බැඳුණු අනෙක් අයගේ පත්වීම් ලිපිවල තම පත්වීම් ලිපියෙහි සඳහන් කර ඇති පරිදි, විශ්‍රාම ගන්වන වයස අවුරුදු 60 ලෙස සඳහන් කර ඇති බවත්‍ය.

පළමුවන පාර්ශ්වකරු තව දුරටත් සඳහන් කර ඇත්තේ, ලිඛිත දේශනය සමඟ තම හැඳුනුම්පතේ සහතික කළ පිටපතක්ද, උප්පැන්න සහතිකයේ පිටපතක්ද, ඊට අමතරව ආයතනයේ තවමත් සේවය කරන බවට සඳහන් කර ඇති ඩබ්. ඩී. ශ්‍රියානි මහත්මිය විසින් 2024.11.12 දිනැතිව ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශයත් ද ඇයගේ හැඳුනුම්පතේ පිටපතක්ද, කේ. කේ. කේ. ලිසිකා හෙවත් ලසිකා කොඩිතුවක්කු යන අය ඉදිරිපත් කර ඇති දිවුරුම් පෙත්සමක් සහ ඇයගේ හැඳුනුම්පතේ සහතික කළ පිටපතක්ද, ඉදිරිපත් කර ඇති බවත්‍ය.

පළමුවන පාර්ශ්වකරු තම ලිඛිත දේශනයෙහි සඳහන් කර ඇත්තේ, දෙවන පාර්ශ්වකරු විසින් තමා වෙත නිකුත් කරන ලද සහ දැනටමත් ඇය ළඟ ඇති බේරුම්කරණය වෙත ඉදිරිපත් කරන ලද තම පත්වීම් ලිපියෙහි තම නම අත්තනායක මුදියන්සේලාගේ රමණී අත්තනායක ලෙස සඳහන් වන අතර, දෙවන පාර්ශ්වකරු විසින් බේරුම්කරණය වෙත ඉදිරිපත් කරන ලද පත්වීම් ලිපියෙහි (R`1) තම නම සඳහන් කර ඇත්තේ යාගොඩ අත්තනායක මුදියන්සේලාගේ රමණී චන්ද්‍රිකා අත්තනායක ලෙස බවත්, දෙවන පාර්ශ්වකරු විසින් තමා වෙත නිකුත් කරන ලද තම පත්වීම් ලිපියෙහි විශ්‍රාම ගන්වන වයස ලෙස, වයස අවුරුදු 60 ලෙස සඳහන් වන අතර, දෙවන පාර්ශ්වකරු සන්තකයේ ඇති තම පත්වීම් ලිපියෙහි (R.1) විශ්‍රාම ගන්වන වයස, අවුරුදු 50 ලෙස සඳහන් වන බවත්, තමා ළඟ ඇති තම

පත්වීම් ලිපියෙහි, මානව සම්පත් කළමනාකරු වශයෙන් තබා ඇති අත්සන, දෙවන පාර්ශ්වකරු ලඟ ඇති තම පත්වීම් ලිපියෙහි (R`1) මානව සම්පත් කළමනාකරු වශයෙන් තබා ඇති අත්සනට වඩා වෙනස් බවත්, තමා ලඟ ඇති තම පත්වීම් ලිපියෙහි මානව සම්පත් කළමනාකරුගේ නිල මුද්‍රාවක් තබා ඇති නමුත්, දෙවන පාර්ශ්වකරු විසින් ඉදිරිපත් කරන ලද තම පත්වීම් ලිපියෙහි (R`1) එවැනි නිල මුද්‍රාවක් තබා ඇති බවත් පෙනී නොයන බවත්ය.

පළමුවන පාර්ශ්වකරු තම ලිඛිත දේශනයෙහි තව දුරටත් සඳහන් කර ඇත්තේ, තමා එම ආයතනයේ කොවිඩ් වසංගතය පැවති වකවානුවේ පවා කැපවීමෙන් යුතුව වැඩකළ බවත්, තමා සමග සේවයට බැඳුණු තවත් අය වයස අවුරුදු 50 ඉක්මවා දෙවන පාර්ශ්වකරුගේ ආයතනයේ සේවය කරන බවත්, වයස අවුරුදු 50 සම්පූර්ණ වූ දිනයේදී විශ්‍රාම ගන්වන ලද්දේ පෞද්ගලික පලිගැනීමක් නිසා බවත්, කෙසේ වෙතත්, තමා නැවත සේවයේ පිහිටුවන ලෙස දුරකථනය මගින් ඇමතුමක් ලබා ඉල්ලීමක් කළ බවත් එහෙත් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලද බවත්, ඒ හේතුවෙන් තමන් ඒ පිළිබඳව පානදුර කම්කරු කාර්යාලයට 2022.10.04 දිනැතිව පැමිණිල්ලක් කළ බවත්, වසර 50 සම්පූර්ණ වන දිනයේදී තමා විශ්‍රාම ගැන්වීම මගින් මානව සම්පත් කළමනාකරු තමාගෙන් පෞද්ගලික පලිගැනීමක් කර ඇති බවත්, ඒ මගින් තම කීර්තියට හානියක් සිදුකර ඇති බවත්, අදාළ ලිපි ලේඛන වල සත්‍ය පිටපත් ඉදිරිපත් කරන බවත්, තමාට සාධාරණයක් ඉටුකරන ලෙසත්ය.

**7.0 අනාවරණය වූ කරුණු පිළිබඳ නිරීක්ෂණ**

පළමුවන පාර්ශ්වකරුගේ පත්වීම් ලිපිය අත්සන් තැබූ එවකට මානව සම්පත් කළමනාකරු වශයෙන් කටයුතු කළ මදුරසිංහ මහතා, සමථකරණයේදී හෝ බේරුම්කරණයේදී කිසියම් ප්‍රකාශයක් ලබා දී නැත. එමෙන්ම දෙවන පාර්ශ්වය ඉදිරිපත් කරන ලද නිර්ව්‍යාජ බවට සඳහන් කරන ලිපියේ 1 සිට 15 - 9 දක්වා වූ ඡේද අතර ඇති පරතරය බෙහෙවින් වෙනස් වී ඇත. එමෙන්ම එම ලිපිය 1 හා 2 ඡේදවල අකුරුවල ප්‍රමාණය 11 වන බව පෙනී යන අතර 3 වන ඡේදයේ සිට වචනවල ප්‍රමාණය වෙනස්කර දක්වා ඇත. තවද, 15.9 වගන්තියට හා 16 වගන්තිය අතර පේළි පරතරය ලිපියේ සෙසු පේළි අතර පරතරයට වඩා අසාමාන්‍ය ලෙස විශාල වූ පරතරයක් දක්නට ලැබේ.

එම පත්වීම්ලිපියේ (R1) විශ්‍රාම ගන්වන වයස ලෙස සඳහන් කර ඇත්තේ කාන්තාවන් වයස 50 සහ පුරුෂ වයස 55 ලෙසය. දෙවන පාර්ශ්වය ඒ සඳහා හේතුවක් ලෙස සඳහන් කළේ, එවකට පැවති විශ්‍රාම ගැන්වීමේ වයස රජයේ ප්‍රතිපත්තිය වූ වයසම මෙහි ඇතුලත් කර ඇති බවය. එසේ වුවද, එවකට පැවති ප්‍රතිපත්තිය කුමක්දැයි ඔහු ඉදිරිපත් කිරීමට සමථකරණයේදී පොරොන්දු වී තිබුණේ වී නමුත්, එය ඉදිරිපත් කර නැත. කෙසේ වෙතත් මේ වනවිට රාජ්‍ය සේවකයින්ගේ (ස්ත්‍රී/පුරුෂ) විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 වශයෙන් ක්‍රියාත්මක වූ අතර, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 විය යුතු බවය. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අංක PED සහ 2013.10.05 දිනැති අංක 1/2023 දරන චක්‍රලේඛයේ දක්වා ඇත. ඒ අනුව එම අවධිය වනවිට පුද්ගලික අංශයේද විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60ක් ලෙස භාවිතා කළ බවට සැකයක් නැත.

ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය (Employers’ Federation of Ceylon) සම්මේලනයේ ප්‍රධාන ලේකම් වශයෙන් එවකට කටයුතු කළ ඊ. එෆ්. ජී. අමරසිංහ මහතා විසින් රචිත Manual of Procedure - Monograph No. 13 (3rd Edition 2007) නම් වූ ග්‍රන්ථයේ සඳහන් කර ඇත්තේ, “The age of retirement is a mater which has to be specifically agreed between the employer and the employee and set out the letter of appointment.” And “the age of retirement in most organization is 55 years.” යනුවෙනි. ඒ අනුව දෙවන පාර්ශ්වය විසින් තමන් නිකුත් කළා යැයි කියමින් ඉදිරිපත් කරන ලද විශ්‍රාම ගැන්වීමේ ලිපියෙහි (R1) වයස අවුරුදු 50 ලෙස සඳහන් කර තිබීම තාර්කික කරුණක් නොවන බව පෙනීයයි. එනයින්ම එම පත්වීම් ලිපිය නිර්ව්‍යාජ පත්වීම් ලිපියක් ලෙස පිළිගැනීමට බේරුම්කරු මැලිවෙන අතර, විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 ලෙස සඳහන් කර ඇති පළමුවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද පත්වීම් ලිපිය නිර්ව්‍යාජ පත්වීම් ලිපිය ලෙස පිළිගැනීමට සිදුවේ.

**පළමුවන පාර්ශ්වයේ ඉල්ලීම පිළිබඳව සලකා බැලීම.**

පළමුවන පාර්ශ්වය විසින් පානදුර කම්කරු කාර්යාලයට ඉදිරිපත් කරන ලද 2022.10.04 දාතම දරන පැමිණිල්ල මගින් සඳහන්කර ඇත්තේ තමන්ගේ වයස වසර 50 වනවාත් සමගම තමා විශ්‍රාම ගැන්වීම මගින් තමාට අසාධාරණයක් සිදුවී ඇති බවත් එහෙයින් තමාට සාධාරණයක් ඉටුකර තමාට සිදුවී ඇති අසාධාරණය වෙනුවෙන් සහනයක් ලබා දෙන ලෙසත්ය. එයින් පළමුව, පළමුවන පාර්ශ්වකරුට අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න විමසීමට ලක් කොට දෙවනුව, ඇයට හිමිවිය යුතු සහනය කුමක්ද යන්න සළකා බැලීම උචිත වේ.

**පළමුවන පාර්ශ්වකරුට අසාධාරණයක් සිදුවී ඇති බව**

කම්කරු කොමසාරිස් විසින් හඳුනාගෙන ඇති පරිදි, කම්කරු ආරාවුලට පදනම වන්නේ පළමුවන පාර්ශ්වකරු වන ඒ. එම්. ආර්. චන්ද්‍රිකා අත්තනායක මහත්මියට ලබා දී ඇති පත්වීම් ලිපියෙහි විශ්‍රාම ගන්වන වයස අවුරුදු 60 ලෙස සඳහන්ව තිබියදී ඇයව වයස අවුරුදු 50 දී විශ්‍රාම යැවීමෙන් අසාධාරණයක් සිදුවී තිබේද යන්න විසින් නිරීක්ෂණය කරන ලෙසත් එසේ නම් හිමිවිය යුතු සහනය කුමක්ද යන්න තීරණය කරන ලෙසය.

ඉහත සඳහන් කරුණු හා ඒ පිළිබඳ කරන ලද විශ්ලේෂණය අනුව, දෙවන පාර්ශ්වය විසින් පළමුවන පාර්ශ්වකරු වසර 50 සම්පූර්ණ වූ අවස්ථාවේදීම විශ්‍රාම ගැන්වීම නිසා තම පත්වීම් ලිපියේ සඳහන් කාලයට වඩා වරස දහයක කාලයක් අඩුවෙන් විශ්‍රාම ගැනීමට ඇයට සිදුවී ඇත. ඒ නිසා ඇයට ආර්ථික වශයෙන්ද, මූල්‍ය වශයෙන්ද, පාඩුවක් සිදුවී ඇති අතර, මානසික වශයෙන්ද, පීඩාවට පත්වී ඇති බවත් එනයින්ම පළමුවන පාර්ශ්වකරුට අසාධාරණයක් සිදු වී ඇති බවත් එනයින්ම පළමුවන පාර්ශවකරුට අසාධාරණයක් සිදුවී ඇති බවත් බේරුම්කරු පිළිගනී.

**පළමුවන පාර්ශවට හිමිවිය යුතු සහනය**

ඉහත සඳහන් කළ පරිදි දෙවන පාර්ශ්වකරුගෙන් පළමුවන පාර්ශ්වකරුට අසාධාරණයක් සිදුවී ඇති බැවින් ඒ පිළිබඳව සහනයක් ලබා ගැනීමට පළමුවන පාර්ශ්වකරුට හිමිකමක් ඇත.

එහෙයින් (1). හැකි ඉක්මනින් දෙවන පාර්ශ්වය විසින් කලින් පැවති සමථකරණයේදී දෙවන පාර්ශ්වකරු එකඟව සිටි පරිදි පළමුවන පාර්ශ්වකරු සේවයේ පිහිටුවන ලෙසත්, පළමුවන පාර්ශ්වකරු විශ්‍රාම ගැන්වූ දිනයේ සිට නැවත සේවයේ පිහිටුවන දිනය දක්වා ඇයට නොගෙවන ලද වැටුප් ගණනය කර මුදලින් ගෙවීමටත්, දෙවන පාර්ශ්වකරුට බේරුම්කරු විසින් නියම කරනු ලැබේ.

එසේ නොමැතිනම්,

පළමුවන පාර්ශ්වකරු විශ්‍රාම ගැන්වූ දිනයේ සිට මෙම නියෝගය ගැසට් කරන දිනය දක්වා වූ දිනයේ සිට වසර 60 සම්පූර්ණ වන 2030.12.08 දිනය දක්වා කාලය සඳහා ගණනය කරනු ලැබූ මුදලක්, එනම් රු. (35000 x 120) රු. 4,200,000/- (රුපියල් මිලියන 4.2) ක් පළමුවන පාර්ශ්වකරුට ගෙවීම සඳහා දෙවන පාර්ශ්වකරුට බේරුම්කරු විසින් නියම කරනු ලැබේ.

(2). ඉහත සඳහන් අංක (1) නියෝගය පරිදි දෙවන පාර්ශ්වකරු ක්‍රියා කරන්නේ නම් මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු මසක් ඇතුළත පළමුවන පාර්ශ්වකරු ඉල්ලා සිටින පරිදි නැවත සේවයේ පිහිටුවීමට දෙවන පාර්ශ්වය ක්‍රියා කළ යුතු අතර සේවයේ පිහිටුවන දින දක්වා මාසිකව ඇය ලබමින් සිටි වැටුප වන රු. 35000/- ගණනේ ගණනය කර ඒ හා සමාන මුදලක් ගෙවිය යුතු බවටද තීරණය කරමි.

තවද,

(3). ඉහත පළමුවන නියෝගය පරිදි පළමු වන පාර්ශ්වකරු සේවය පිහිටුවා ලැබිය යුතු හිඟ වැටුප ගෙවීමට දෙවන පාර්ශ්වකරු ක්‍රියා කරන්නේ නම්

(අ) මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාසයක් ඇතුලත පළමු වන පාර්ශ්වකරු සේවය පිහිටු වීමටත්

(ආ) පළමු වන පාර්ශ්වකරුට ලැබිය යුතු හිඟ වැටුප ගෙවන බව තහවුරු කරනු වස් ඒ හා සමාන මුදලක් ලෙස සැලකිය හැකි හිඟ මුදල වන(රු.35,000 x 60 = රුපියල් මිලියන 2.1) මුදල සහ ඒ සඳහා වන නෛතික පොලිය වශයෙන් 2020.12.08 දින සිට ගණනය කළ යුතු 12%ක පොලී මුදලක් මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාසයක් ඇතුලත පානදුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට ද දෙවන පාර්ශ්වයට නියම කරමි.

(4). ඉහත දෙවන නියෝගය පරිදි දෙවන පාර්ශ්වකරු විසින් පළමු වන පාර්ශ්වකරු සේවයේ නොපිහිටුවා විශ්‍රාම ගැන්වූ දිනයේ සිට පළමු වන පාර්ශ්වකරුට ලැබිය යුතු හිඟ වැටුප ගෙවීමට ක්‍රියා කරන්නේ නම් මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාසයක් ඇතුලත පළමු වන පාර්ශ්වකරුට ගෙවිය යුතු මුදල එනම් (රු.35,000 x120 = රුපියල් මිලියන 4.2) ලෙස ගණනය කර ඒ හා සමාන මුදලක් ගෙවිය යුතු බවට ද තීරණය කරමි.

(5). ඉහත සඳහන් කළ පරිදි එනම් පළමු වන නියෝගය පරිදි හෝ දෙවන නියෝගය පරිදි ක්‍රියා කිරීමේ දී හිඟ මුදල ගෙවන විට එම හිඟ මුදලට අදාළ කාල පරිච්ඡේදය ආයතනයේ සේවය කළ සේ සලකා පළමු වන පාර්ශ්වකරු වෙනුවෙන් අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල ව්‍යවස්ථාවන්ට අනුකූලව ගණනය කර එම මුදල් ඒ ඒ අරමුදල් වෙත ගෙවිය යුතු බවට ද තිරණය කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බවට තීරණය කරමි.

**ආචාර්ය ඒ. ඒච්. ගමගේ,**
බේරුම්කරු.

2025 ජුනි මස 18 වැනි දින.

EOG 07 - 0290